## ලුණුගල ප්‍රාදේශිය සභාව 2022.06.23 වන දින පැවති
## මාසික මහ සභා රැස්වීම් වාතර්ාව

2022 ජුනි මස සාමාන්‍ය මහ සභා රැස්වීම 2022.06.23 වන දින පෙ.ව.10.00 ට ගරු මූලාසනය චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් හා පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ සහභාගිත්වයෙන් සභා රැස්වීම් කටයුතු ආරම්භ කරන ලදී.

**මෙදින පැමිණීම,**

1. ගරු සභාපති — චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා
2. ගරු උප සභාපති — ධම්මලිංගම් සෙල්වරාණි මැතිනිය
3. ගරු මන්ත්‍රී — මොහොම්මදු ජෙමීල් මෙහොම්මදු ජරෝ මැතිතුමා
4. ගරු මන්ත්‍රී — පෙරියසාමි ලෝගනාදන් මැතිතුමා
5. ගරු මන්ත්‍රී — පලනියන්ඩි සුබ්‍රමනියම් මැතිතුමා
6. ගරු මන්ත්‍රී — ශ්‍රී හස්ත ලේකම්ලාගේ චන්දන සමන් කුමාර මැතිතුමා
7. ගරු මන්ත්‍රී — සුමනාවති මැතිනිය
8. ගරු මන්ත්‍රී — ජෙයකුමාර් පරමසිවම් මැතිතුමා
9. ගරු මන්ත්‍රී — දිසානායක මුදියන්සේලාගේ අසංක විජේබංඩාර මැතිතුමා
10. ගරු මන්ත්‍රී — පතිරණගේ කුමාරසිරි සමරවීර මැතිතුමා
11. ගරු මන්ත්‍රී — රාමන් ජේයශංකර් මැතිතුමා
12. ගරු මන්ත්‍රී — මුරුගයියා ගනේෂමූතරී මැතිතුමා
13. ගරු මන්ත්‍රී — රෙන්ගසාමි කනගසුන්දරි මැතිනිය
14. ගරු මන්ත්‍රී — දිසානායක මුදියන්සේලාගේ තිලකසිරි දිසානායක මැතිතුමා
15. ගරු මන්ත්‍රී — මාපා බණ්ඩාරලාගේ සමන් කුමාර මැතිතුමා
16. ගරු මන්ත්‍රී — රාජේන්ද්‍රන් මහාදේවි මැතිනිය
17. ගරු මන්ත්‍රී — වික්‍රමසිංහ ආරච්චි පතිරණලාගේ අනුර වික්‍රමතුංග මැතිතුමා
18. ගරු මන්ත්‍රී — රාජපක්ෂ වත්තේ විදානේලාගේ ඇඩ්වින් මැතිතුමා
19. ගරු මන්ත්‍රී — අබේකෝන් මුදියන්සේලාගේ ජයවීර අබේකෝන් මැතිතුමා

**න්‍යාය පත්‍රයට අනුව සභාවේ වැඩ කටයුතු ආරම්භ විය**

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

පසුගිය සභාව වාතර්ාව සියලුම ගරු මන්ත්‍රීවරුන් හට ලැබී ඇති බැවින්, එම වාතර්ාව කියෙව්වා සේ සලකා සභා සම්මත කළ යුතුයි. එබැවින් පසුගිය සභා වාතර්ාව සභා සම්මත කිරීම සඳහා අවස්ථාව ලබාදෙමි.

## 01. පසුගිය සභා වාතර්ාව සභා සම්මත කර ගැනීම (2022.05.24)

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

පසුගිය සභා වාතර්ාවේ සංශෝධන ඉදිරිපත් කිරීම සඳහා සභාවේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය ලබාදෙන ලෙස ඉල්ලා සිටිමි.

ඒ සඳහා සියලුම ගරු මන්ත්‍රීවරුන් අත ඔසවා එකඟතාවය ලබාදෙන ලදී.

**01/1. සංශෝධන**

**ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමා**

මා විසින් ප්‍රකාශ කරන ලද පහත සඳහන් කරුණු කිහිපයක් පසුගිය සභා වාතර්ාවෙහි සඳහන්ව නොමැති බැවින්, එය සංශෝධනය විය යුතු බව ප්‍රකාශ කරමි.

01. පසුගිය වාතර්ාවේ සඳහන්ව ඇත්තේ මඩොල්සිම ජල ගැටළුවක් පවතින බවත්, ඒ සඳහා විසඳුම් ලබා දිය යුතු බවත් පමණි. නමුත් මා විසින් පැවසුයේ මඩොල්සිම ජල ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදු කර කොන්ත්‍රාත්කරු විසින් අමුණුදෝව ප්‍රදේශයේ සිදු කළ ව්‍යාපෘතියක් සඳහා මුදල් ප්‍රතිපාදන නොලද බැවින්, මඩොල්සිම ජල ව්‍යාපෘතිය නිම කිරීමට නොහැකි වූ බවත්ය. එය වාතර්ාවේ සඳහන් විය යුතුය.

02. පෙට්‍රල් හා ඩීසල් බස් රථ වලට පුරවා ගනිමින් වතුකරයට ගොස් වැඩි මිළට විකුණනු ලබන අතර, මේ පිළිබඳව පොලිස් ස්ථානය දැනුවත් කරන මෙන් පැවසූ අතර, එය සභා වාතර්ාවේ සඳහන් විය යුතු යුතුය.

03. ප්‍රාදේශිය සභා හා පළාත් සභා මඟින් ඉදි කරනු ලබන මාගර් වල එක් පසක බැම්මක් සකස් කරන මෙන් ඉල්ලා සිටි අතර, එය සභා වාතර්ාවේ සඳහන් විය යුතු යුතුය.

04. මඩොල්සිම කසල බැහැරලන ස්ථානය අසල ඉඩම සභාවට පවරා ගන්නා මෙන් ඉල්ලා සිටි අතර, එය සභා වාතර්ාවේ සඳහන් විය යුතු යුතුය.

**2022.05.23 වන දින පැවති මහ සභා රැස්වීම් වාතර්ාව ඉහත සංශෝධන වලට යටත්ව සත්‍ය වාතර්ාවක් බව සභා සම්මත විය යුතු බවට ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථීර කිරීමෙන් අනතුරුව පසුගිය සභා වාතර්ාව සියලුම ගරු මන්ත්‍රීවරුන් අත ඔසවා ඒකමතිකව සම්මත කරන ලදී.**

## 02. ගරු සභාපතිතුමාගේ නිවේදන :-

02/1. ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩමුළුව සම්බන්ධව ගරු සභාව දැනුවත් කරන ලදී.

02/2. පළාත් පාලන ආයතන සතු හිස් ඉඩම් සහ කායර්ාල පරිශ්‍ර ඵලදායි ලෙස වගා කටයුතු සඳහා යොදවා ගැනීම සම්බන්ධව ගරු සභාව වෙත දැනුම් දෙන ලදී.

**ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා**

ආයතන ප්‍රධානීන් එකඟවුවහොත් පමණක් මෙම ඉඩම් ලබා දිය හැකි බව ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා පසුගිය දිනෙක පැවසීය. ඒ අනුව පුද්ගලික වතු හිමියන් කෙදිනක හෝ මෙම යෝජනාවට එකඟ වන්නේ නැත. 1991 වෂර්යේදී පමණ හිටපු ගරු අමාත්‍ය තොණ්ඩමන් මැතිතුමා විසින් මෙම ඉඩම් ලබා දීමේදී ඒවායේ පූණර් හිමිකාරිත්වය ආණ්ඩුව සතු කොට තිබෙනවා. ඒ අනුව ගරු අමාත්‍ය රමේෂ් පතිරණ මැතිතුමා සිදු කළ ප්‍රකාශය මා හෙළ දකිනවා. ජනතාව සතු වගා නොකල ඉඩම් වගා කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසත්, හිස්ව පවතින බොහෝ වතු බංගලා ජනසතු කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා**

මේ සම්බන්ධව ප්‍රාදේශිය ලේකම්තුමා දැනුවත් කිරීමෙන් අනතුරුව එම තීරණ අප සභාවේ නියෝජිතයින් හමුවට ඉදිරිපත් කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

වගා කිරීම සම්බන්ධව මාස 06ට පෙර යෝජනාවක් සභා ගත කරනු ලැබූ නමුත් එයට සාර්ථක ප්‍රතිචාරයක් ලැබුනේ නැත. මා සතු කොට්ටල්බැද්ද ප්‍රදේශයේ පිහිටි අක්කර 02 ක කුඹුරක් වගා කටයුතු සඳහා ප්‍රාදේශීය සභාවට බදු දීමට කැමැත්ත ප්‍රකාශ කරමි.

**<u>මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා.</u>**

වගා සංග්‍රාමය ආරම්භ කරනවා නම් යපම්ම පිහිටි ඉඩම් කොටස ඒ සඳහා යොදා ගත හැකිය.

**<u>ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා.</u>**

පසුගිය සභා වාතර්ාවේ ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ඉදිරිපත් කරනු ලැබූ ලුණුගල එල්රෝඩ් හි පදිංචි, ටී.කුමාර් යන අයගේ අදාළ ස්ථානීය පරීක්ෂණය සඳහා අද දින යොදා ගැනීමට හැකිය.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමවීර මැතිතුමා.</u>**

මේ වනතුරු කිසිදු පුද්ගලයෙකු හෝ ආයතනයක් එතුමාට සහය දැක්වීමට ඉදිරිපත්ව නැත. එතුමා සාර්ථක ව්‍යවසායකයෙකු කිරීමට පුද්ගලිකව මා මැදිහත් වන බව සඳහන් කරමි.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

අප ප්‍රාදේශයි සභාවේ විශාල සේවක පිරිසක් සේවය කරනු ලබනවා.ඇතැම් අයට සිදු කිරීමට විශේෂිත රාජකාරි කිසිවක් නොමැත. විශාල ව්‍යාපෘති සඳහා ගමන් කිරීමට පෙර ආයතන පරිශ්‍රය අවට යම් යම් වගා ව්‍යාපෘති සිදු කිරීම වැදගත්ය. මේ පිළිබඳව සභා ලේකම්තුමියගේ විශේෂ අවධානය යොමු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**<u>02. ගරු සභාපතිතුමාගේ නිවේදන :-</u>**

**02/3**. ධාවන කිලෝ මීටර් සංඛ්‍යාව සම්පූර්ණ වීමෙන් පසු භාවිතයෙන් ඉවත් කරන ලද වාහන ටයර් නැවත පිරවීම සඳහා තාක්ෂණික අනුමැතිය ලබා ගැනීම පිළිබඳව සභාව දැනුවත් කරන ලදී.

**<u>ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා</u>**

ටයර් නැවත පිරවීම සම්බන්ධව විටින් විට විවිධ නිළධාරින් විසින් ගනු ලබන තීරණ හේතුවෙන් මෙවැනි වටිනා තීරණයක් ක්‍රියාත්මක කොට මුදල් ඉතිරි කර ගැනීමට නොහැකි වී ඇත. ඒ අනුව සභා තීරණයක් මත ට්‍රැක්ටර් රථය, බැකෝ ලෝඩර් යන්ත්‍රය වැනි වාහන තෝරාගෙන මෙම යෝජනාව ක්‍රියාත්මක කළ හැකිය. මේ සඳහා විශේෂ අවධානය යොමු කරන මෙන් ඉල්ලා සිටිමි.

**<u>ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

පළාත් යාන්ත්‍රික අධ්‍යක්ෂ වෙත මෙම තීරණය යොමු කර ඒ අනුව ඉදිරි කටයුතු සිදු කරන මෙන් සභා ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදි.

**<u>03. සංදේශ/ පෙත්සම්/ පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම</u>**

**<u>ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

**03/1.** ලුණුගල, සිල්ක්ෆාම් හි පදිංචි ආරුමුගම් එළිසබෙත් මේරි යන අය විසින් යොමු කරනු ලැබූ වෛද්‍යාධාර ලබා ගැනීම සම්බන්ධ ලිපිය සභා ගත කරන ලදි.

**<u>ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා</u>**

මෙම රෝගියා වෙනුවෙන් ලබා ගත හැකි සියළුම සහයෝගයන් වෙනුවෙන් ක්‍රියාත්මක විය යුතුය. ආණ්ඩුකාරතුමා වෙත මේ සම්බන්ධව තොරතුරු යොමු කිරීම තුලින් රු.50,000.00 ක් වැනි ආධාර මුදලක් ලබා ගත හැකිය. ඒ පිළිබඳව ලිපි යොමු කොට එහි පිටපතක් මා වෙත ලබා දීමට කටයුතු සලස්වන මෙන් ඉල්ලා සිටිමි.

**03/2.** මැටිගහතැන්න පුස්තකාලය පිහිටි ඉඩමේ ගස් 44 ක් සම්බන්ධයෙන් වන තක්සේරු වාතර්ාව මේවනවිට ලැබී ඇත. එය වට මීටර් ලෙස නිවැරදි විය යුතු අතර, එහි වටිනාකම රු.488988.20 කි. ප්‍රාදේශීය ලේකම්තුමා සමඟ සාකච්ඡා කොට ඉදිරි කටයුතු සිදු කළ හැකිය.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා</u>**.

ලුණුගල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පුද්ගලයින් ටෙන්ඩර් ගැනීමට අපේක්ෂාවෙන් පසු වන හෙයින් ටෙන්ඩර් දැමීමට කටයුතු කළ යුතුයි.

**<u>ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා.</u>**

අරවාකුඹුර රෝහණ යන අයට ටෙන්ඩර් ලබා දෙන්නේ නම් මාගේ විරෝධතාවය පළ කර සිටිනවා.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා.</u>**

ටෙන්ඩර් කරන්න. මිළ තීරණය කිරීම සඳහා සභාවට බලය ලබා දෙන්න.

**<u>ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

සභාවට මිළ තීරණය කිරිමේ හැකියාවක් නොමැත. ඔබතුමාට ඒ සම්බන්ධව දැනුමක් තිබෙනවාද යන්න ගැටළුවකි.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා**

වට අඩි 15 ක් වන ගසක වටිනාකම කොපමණද? මේ වන විට සභාව ආදායම් අතින් දැඩි අසීරුතාවයට පත්ව සිටින අවස්ථාවක්. එම නිසා වැඩි වටිනාකමකට ටෙන්ඩර් කිරිම කළ යුතුයි.

**ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා.**

මාගේ නිවසේ මාසික ආදායම රු.ලක්ෂ 1 ½ කි. ඒ හැර වෙනත් මාගර්යන් මඟින් මුදල් ඉපයීමේ අවශ්‍යතාවයක් නොමැත.කිසිදු ඩීල් ගැසීමක් මාගේ නොමැත.මෙවැනි යෝජනාවකදී සියළු පක්ෂ එක්ව කටයුතු කළ යුතුය.එසේම මේ සම්බන්ධ සියලුම කටයුතු නීත්‍යානුකූලව සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා. මම පළාත් සභාවේ ද කටයුතු කරන ලද මන්ත්‍රීවරයෙකි. අදටත් එම ස්ථානයට ගිය පසු ගරුත්වය එලෙසම පවතිනවා. යටින් ගේම් ගහනවා යනු කුමක්ද කියා හෝ මා දන්නේ නැත. සභා ලේකම්තුමියගේ ප්‍රධානත්වයෙන් සියලු කටයුතු සිදු කරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා**

ගස් 10 බැගින් ලබා දිය හැකි ක්‍රමයක් තිබෙනවාද?

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

එලෙස සිදු කිරිමේ හැකියාවක් නොමැත.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

විවෘත ටෙන්ඩර් කිරිමේ ක්‍රමවේදයක් අනුගමනය කරමු.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා.**

අපේ සම්පතක් වන මෙම ගස් තක්සේරුවට අනුව ටෙන්ඩර් කළ යුතුයි කියා නියමයක් නොමැත.අප සභාවෙන් අවම ලංසුව ලෙස රු.ලක්ෂ 15 ක් තීරණය කරමු.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා**

මෙලෙස කටයුතු කිරිමට හැකියාව තිබියදී ඇයි ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා කලබල වන්නේ.

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

එකඟතාවයක් නොමැති නම් දැව සංස්ථාවට ගස් ලබා දිය හැකිය.තක්සේරුවට අභියෝග කළ නොහැකිය.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

ගරු මන්ත්‍රී මණ්ඩලය අත් උස්සලා ගරු ඔබතුමාව සභාපති ධූරයේ පිහිටවනු ලැබුවේ මෙලෙස නිශේධ බලය පාවිච්චි කිරිමට නොවේ.

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

මෙම වටිනාකම අවම මුදල ලෙස යොදවමින් වැඩි වටිනාකමක් සඳහා ගස් ලබා දීමට කටයුතු කරමු.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා.**

මීට පෙර සභා භූමියේ මෙම වගර්යේම ගස් 07 ක් තිබූ අතර මීට වසර ගණනාවකට පෙර එක් ලක්ෂ ගණනකට එම ගස් විකුණනු ලැබුවා. එම ගස් 07 සඳහා ඒ කාලයේ එවැනි වටිනාකමක් ලැබුනා නම් අද වන විට ලැබෙන වටිනාකම පිළිබඳව සිතා ගත නොහැකිය.කාගේ තීරණයක් වුවද අප සභාවෙන් තීරණයක් ලබා ගමු. අපට තිබෙන පුද්ගලික ඉඩමක් අඩුවෙන් තක්සේරු කල හොත් අප එය ලබා දෙන්නේ නැතිවා සේම මේ සම්බන්ධව ද කටයුතු කළ යුතුයි.අවම ලංසුව ලක්ෂ 15 ලෙස තීරණය කරමු. හදිසියේම ගස් ටෙන්ඩර් කිරිම සිදු කිරිමේ අවශ්‍යතාවයක් නැත. ලබන මාසේ තීරණයක් ලබා ගනිමු. කෙසේ වෙතත් ගිය මාසේ ලද මෙම තක්සේරු වාතර්ාව එම මාසයේම සභාවට යොමු නොකිරිම ගැටළු සහගතය.

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා**

මුලින්ම මෙම යෝජනාව රැගෙන ආවේ මා වුද මේ සම්බන්ධව මා කිසිදු අයුරකින් හෝ දැනුවත් කොට නොමැත.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා**

මේ වේලාවේ ගස් කපලා විකුණන්න අයිතියක් අප හට නොමැත. අපට ලක්ෂ ගණනක ආදායමක් ලබා ගැනිමට හැකියාව තිබියදී ඊට විරුද්ධ වන්නේ ඇයි ද යන්න ගැටළුවක් නොවේද? අවම ලංසුව ලක්ෂ 15 ලෙස තීරණය කරමු

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා.**

සතොස ආයතනයේ තක්සේරුව රු.60,000.00 ක් ලෙස ලැබුනි. නමුත් සභාව මඟින් එය රු.150000.00 ක් ලෙස තීරණය කරනු ලැබුවා. ඇයි මෙම තීරණයක් එලෙස ගත නොහැක්කේ.මෙවැනි යෝජනා ඉදිරිපත් කරන විට ඒ සම්බන්ධව සුභවාදී ප්‍රතිචාරයක් ගරු සභාපතිතුමා නොදැක්වීම පිළිබඳව ඇත්තේ කණගාටුවකි.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

එම තක්සේරු වාතර්ාව සභා ගත කරන මෙන් ඉල්ලා සිටිමි.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා</u>**.

බහුතරයක් හිතන්නේ නෑ ඔබතුමා මෙම අවස්ථාවෙන් කොමිස් මුදල් ලබා ගනු ඇතැයි කියා. ඔවුන් හිතන්නේ අඩු තක්සේරු වටිනාකමක් තුලින් සභාවට සිදුවන පාඩුව සම්බන්ධවයි. මේ සම්බන්ධයෙන් ගිය සභා වාරයේදී කතා කරනු ලැබුවද එය වාතර්ාවට ඇතුලත් වී නොමැත.

**<u>ගරු මන්ත්‍රී ආර්.ජෙයශංකර් මැතිතුමා</u>**.

ගැස් නොමැති නිසා දර වලට හෝ දැව විකුණා වැඩි මුදලක් ලබා ගත හැකිය. ඒ තුලින් විශාල ලාභයක් ලබා ගත හැකිය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

අවම ලංසුව ලක්ෂ 04 ලෙස තිබියදී ලක්ෂ 50 ට ඉල්ලන්නේ කව්ද? අප ප්‍රදේශයේ පවතින තරඟකාරිත්වය පිළිබඳ හොඳ අවබෝධයක් අප සතුව තිබෙනවා. දර වලට විකුණුවා නම් විශාල ආදායමක් ලබා ගත හැකි වනු ඇත. පුවත්පත් දැන්වීමක් මඟින් විවෘත ටෙන්ඩර් කිරිමකට යා හැකිය.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා.</u>**

අප සිටින ගොඩනැගිල්ල අයිති ඉඩම තවම පවරා ගෙන නොමැත. අතුරු බඳු දිමක දී මේ තුලින් ගැටළුවක් මතුවිය හැකිය.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

මීට පෙර පැවති සභා කාලයේදී හිටපු ගරු සභාපතිතුමා විසින් ඩබ්.ඒ.පී.ජයතිලක මැතිතුමා සමඟ සාකච්ඡා කොට මෙම ඉඩම පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කල බව මාගේ මතකයේ තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා</u>**.

පළාත් පාලන කොමසාරිස්තුමා සමඟ මා දැන් සාකච්ඡා කරනු ලැබුවා. එතුමා පවසා සිටියේ තීරණය වි ඇති වටිනාකමට වඩා වටිනාකම වැඩි යැයි හැඟි යන්නේ නම් විවෘත පුවත්පත් දැන්වීමක් මඟින් ප්‍රසිද්ධ කළ යුතු බවය.එසේම පස්සර ප්‍රාදේශිය සභාවේ තිබෙනවා ඩබ්.ඒ.පී.ජයතිලක මැතිතුමා විසින් ලබා දුන් ලිපියක්. ගස් කැපීමට අවසර ලබා දී ඇත්තේ එම ලිපිය මඟිනි.

**<u>ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා.</u>**

අද දින ලැබෙන දීමනාවෙන් මා බැනර් 01 ක් සාදා දෙන්නම්.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා</u>**.

ආදායම වැඩිකර ගන්නත් ඕන. ලුණුගල ප්‍රදේශයේම විය යුතුයි යන කොන්දේසි 02 ම සම්පූණර් කර ගත නොහැකිය. එබැවින් විවෘත ලංසුවක් තීරණය කිරිම සුදුසුය.

**<u>03/3. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

**1.** බුදු දහම ශ්‍රී ලංකාවට රැගෙන ඒම නිමිත්තෙන් පොසොන් පොහොය දින ලුණුගල ප්‍රදේශයේ දන්සැල් ඇතුළු විවිධ වැඩසටහන් ක්‍රියාත්මක විය.

එයින් නගරයේ මනුස්සකම සංවිධානය මඟින් සංවිධානය කල බත් දන්සැල, ප්‍රාදේශිය සභාව මඟින් සංවිධානය කළ බත් දන්සැල,ලුණුගල ශ්‍රී ලෝණගිරි පුරාණ විහාරයේ කුළගන සමිතිය මඟින් සංවිධානය කරනු ලැබූ බත් දන්සැල, වේරගොඩ ඉදිආප්ප දන්සැල, පල්ලේකිරුව බත් දන්සැල, පල්ලේකිරුව තේ පැන් දන්සල,බස්නායක මහතා ඇතුළු 2018 සා.පෙළ කණ්ඩායම ඉදිරිපත් කළ කිරි දන්සැල ඇතුළු සියලු පරිත්‍යාගශිලින්ට ප්‍රණාමය පුද කළ යුතුය.

**2.** ඉන්දියානු රජයේ තමිල්නාඩු පරිත්‍යාගශිලින්ගෙන් ලද මුදල් භාවිතා කර වතු කම්කරු ජනතාවට එවන ලද සහල් පරිත්‍යාගය වෙනුවෙන් බෙහෙත් ඇතුලු කිරිපිටි ආහාර ආදිය ලබා දිම පිළිබඳව ලුණුගල ප්‍රාදේශිය සභාවේ ප්‍රණාමය මෙන්ම එම කටයුත්ත සංවිධානය කළ ගරු අගමැති තුමාටත්, දිස්ත්‍රික් ලේකම්තුමිය, ප්‍රාදේශිය ලේකම්වරු, නිළධාරින් හා වතු අධිකාරුවරුන් ඇතුලු සියලුම දෙනාට ප්‍රණාමය පුද කළ යුතුය

**04. කල්දී ඇති ප්‍රශ්න :-**

**ප්‍රශ්න :-**

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/1.** 2018, 2019, 2020, 2021, 2022 මැයි දක්වා විගණන වාර්තා සභා ගත කරන්න (කලින් ඉල්ලා සිටි නමුත් සභා ගත කලේ නැත)

**පිළිතුර**

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

විගණන වාතර්‍ා ප්‍රමාණාත්මකව විශාල වන හෙයින් ඒවා එකින් එක සවිස්තරව සභා ගත කිරිම සඳහා වැඩි කාලයක් ගත වන බැවින් එය ප්‍රායෝගික වන්නේ නැත.ඔබතුමාට අවශ්‍ය ඕනෑම මොහොතක එම වාතර්‍ා කායර්‍ාලයෙන් ලබා ගෙන පරික්ෂා කළ හැකිය.

**ප්‍රශ්න :-**

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/2.** 2018, 2019, 2020, 2021, 2022 මැයි දක්වා ප්‍රදේශයේ සභා අරමුදල් වලින් සහ වෙනත් රජයේ මුදල් වලින් කරන ලද භාණ්ඩ සහ සේවා යෝජනා ක්‍රියාත්මක කළ සභිකතුමා හෝ සභිකතුමිය කරන ලද සංවධර්න යෝජනාව හෝ භාණ්ඩ, ලබාගත් අය ලබාගත් දිනය වටිනාකම එම ක්‍රියාවලියෙන් ප්‍රයෝජන ලබාගන්නා පිරිස වෙන වෙනම පෙන්වා දෙන්න (කලින් ඉල්ලා සිටියේ නැත)

**පිළිතුර**

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ලිඛිතව ලබා දෙන ලදි.

**ප්‍රශ්න :-**

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/3.** 2022 ජනවාරි සිට 2022 ජුනි 20 දක්වා ලුණුගල ප්‍රාදේශිය සභාවේ ධාවනය කල වාහන වල ධාවන සටහන් ගේට්ටු මුරකරුගේ සටහන් සභා ගත කරන්න.

**පිළිතුර**

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ලිඛිතව ලබා දෙන ලදි.

**ප්‍රශ්න :-**

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/4.** ලක්ෂ 2000 ක වියදමක් ඉදිකරන ලද ජල යෝජනා ක්‍රමයේ සැලැස්ම, ඉදිකරන ලද ප්‍රවාහය, තව ඉදිකළයුතු ඉදිකර අවසන් කර භාරදිය යුතු ජල සාම්පල් පරීක්ෂා කරන ස්ථානයේ සේවයේ නියුතු අය සහ ජල යෝජනා ක්‍රමය භාරගත්තේ කුමන පදනමකින්ද සහ කොන්ත්‍රාත්කරු වගකියන කාල සීමාව සභා ගත කරන්න.

**පිළිතුර**

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

100% ක් භාර දී නොමැත. වසරකින් අනතුරුවයි අප ආයතනය වෙත භාර දෙනු ලබන්නේ. Pump House එකට ඊයේ දින විදුලි සම්බන්ධතාවය ලබා ගන්නා ලදි.සුදුසුකම් සහිත පුද්ගලයින් 02 කු මේ වන විට පුහුණුව සඳහා යොදවා තිබෙන නමුත් බඳවා ගැනිම සඳහා අනුමැතිය මේ වනතුරු ලැබි නොමැත. පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් ඉල්ලීම් කලද එතුමා පවසා සිටියේ මේ අවස්ථාවේ ඒ සඳහා අනුමැතිය ලබා දිය නොහැකි බවයි.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

පළාත් පාලන දෙපාතර්මේන්තුවේ ද නිළධාරින්ගෙන් ද සමන්විත කමිටුවක් මඟින් පෙර කායර් මණ්ඩලය බඳවා ගැනිමේදී නිසි අධ්‍යාපන සුදුසුකම් පරික්ෂා කිරිමෙන් තොරවද බඳවා ගනු ලැබුවේ?

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා.**

රැකියා ලබා දීම සම්බන්ධව හෝ සංවධර්න යෝජනා ක්‍රියාත්මක කිරිම සම්බන්ධව කිසිදු විරෝධතාවයක් මාගේ නොමැත. නමුත් හිටපු ඌව පළාත් ගරු ප්‍රධාන අමාත්‍යතුමා මඟින් බඳවා ගනු ලැබු සේවක මණ්ඩලය වෙත පස්සර ප්‍රාදේශිය සභාවෙන් තවමත් ගෙවනු ලබන්නේ රු.10000.00ක මාසික දීමනාවකි. දැනට සභාවේ පවතින තත්ත්වය අනුව රැකියා ලබා දෙන්නේ නම් ඒ පිළිබඳව දෙවරක් සිතා බැලිය යුතුය.

**ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා.**

මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ගැටළු පවතිනවා. කිහිප අවස්ථාවකදීම මේ සම්බන්ධව ලිඛිතව තොරතුරු විමසා සිටියද ඒ තොරතුරු මේ වන තුරු ලබා දී නොමැත.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

මම ද එම ලිපිගොනු සම්බන්ධව ලිඛිතව තොරතුරු ඉල්ලා තිබෙනවා. ඒවා ලද පසු සභාගත කරන්නම්.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා**

යපම්ම ජල ව්‍යාපෘතිය සභාව සමඟ ගිවිසුමක් අත්සන් කොට තිබෙනවා. ඒ කරුණු වලට එකඟ නොවන්නේ නම් නැවත අපටම ලබා දෙන්න.එය 500% ගුණයකින් සාර්ථකව සිදු කර ගෙන යනු ඇත.

එම ගිවිසුම ප්‍රකාරව නව ජල සම්බන්ධතාවයක් ලබා දෙන්නේ නම්ඒ පිළිබඳව අප සමිතියෙන් විමසීමක් සිදු කළ යුතුය.එසේම මෙම ව්‍යාපෘතියෙහි නඩත්තුව පිළිබඳව කිසිසේත්ම සෑහීමකට පත් විය යොහැකිය.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

නන්දපාල මහතා අප ආයතනය වෙත නැවත සේවයට යොදා ගත් අතර ජල ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු කාර්යාලයේ නඩත්තු ඒකකය වෙත භාර දෙන ලදි.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

යපම්ම ප්‍රාථමික විද්‍යාලය දැඩි අනතුරක පවතිනවා.ජලය අවිධිමත් ලෙස බැහැරලීම හේතුවෙන් පාසල් කණ්ඩිය කඩා වැටීමේ අවධානමක පසු වනවා.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා**

නන්දපාල මහතා විසින් පුද්ගලික ආරවුල් මත ජල ව්‍යාපෘතිය ගැටළුකාරි ලෙස හසුරුවනු කරනු ලබන අතර නඩත්තු කටයුතු වෙනුවෙන් එක් ජල නළයක් අවශ්‍ය වූයේ නම් කාර්යාලයෙන් නළ 05 ක් ලබා ගෙන රැගෙන යනු බවය. මේ තත්ත්වය ජනතාව තව තවත් පීඩාවට පත් කරන්නකි.

**ප්‍රශ්න :-**

**04/1. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා**

**04/1/4.** ලුණුගල ප්‍රාදේශිය සභාවේ පහත සඳහන් ආයතන වල 2022 මාතර්‍, අප්‍රේල්, මැයි සියලුම වියදම් සහ ආදායම

1. සූරියගොඩ කොම්පොස්ට් අංගනය
2. සුමුදුගම බහුකාර්‍ය ගොඩනැගිල්ල
3. ZA 5016 ජේ.සී.බී.යන්ත්‍රය
4. UPPC 0370 කැබ් රථය
5. WPPF 7347 ඩබල් කැබ් රථය
6. UPLL කෘ කැබ් රථය
7. UPAAM ත්‍රීවිල් රථය
8. මඩොල්සිම සඳහා කරන සියලුම වියදම්
9. ලුණුගල පුස්තකාලය - 2022 ජනවාරි සිට 2022 මැයි
10. අංග සම්පූර්ණ නවීන වැසිකිළිය - 2022 ජුනි 20 දක්වා (ආදායම වියදම වැටුප් ඇතුලුව)
11. ට්‍රැක්ටර් රථ - 02

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ලිඛිතව ලබා දෙන ලදි.

05. **කල්දී ඇති යෝජනා :-**

**05/1. ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා :-**

**05/1/1.** අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 168(1) වගන්ති ප්‍රකාරව 2023 වෂර්ය සඳහා ලුණුගල ප්‍රාදේශිය සභාවට අදාළ අයවැය ලේඛනයක් පිළියෙල කොට මා විසින් සභාව වෙත ඉදිරිපත් කළ යුතුව ඇත. එබැවින්, 2023 අයවැය සකස් කිරීම සඳහා 2022 ජුනි මස 30 දිනට පෙර ලබා දෙන ලෙස යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/2.** ලුණුගල මහජන පුස්තකාලය සඳහා 2022 මැයි මාසයට අදාළ පුවත්පත් සඟරා සැපයීම වෙනුවෙන් මධුකා ට්‍රේඩ් සෙන්ටර් ආයතනයට රු.10810.00 මුදලක් ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම මුදල් ගෙවීම සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/1/3.** බදුල්ල දිසා අධිකරණයේ පවරා ඇති නඩු අංක M/50 (ඩී.එම්රුක්මාලී ගුණරත්න - 2018 වෂර්යේ බදුගත් ලුණුගල මීරිදිය මාළු වෙළඳසැලෙහි හිඟ කඩකුලී නොගෙවීම) හා නඩු අංක M/51 (එම්.ඩී.ශාලික රංගජීව - 2018 වෂර්යේ බදුගත් ලුණුගල මීරිදිය මාළු වෙළඳසැලෙහි හිඟ කඩකුලී නොගෙවීම) නඩු සඳහා වෘත්තිය ගාස්තු වශයෙන් රු.5000.00 ක මුදලක් නීතිඥ ආර්.එම්.දිමුතු ප්‍රේමරත්න මහතාට ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා ගැනීමට යෝජනා කරමි

එම යෝජනාව ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා</u>

සභාවට මේ වන විට කිසිදු ආදායම් මාගර්යක් නැහැ. මස්කඩ, මාළු කඩ නැහැ. නඩු සඳහා නීතිඥ ගාස්තු කොපමණ ප්‍රමාණයක් වැය කරනවාද යන්න පිළිබඳව සිතා බැලිය යුතුයි.

<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>

එම ලිපිගොනුව නැවත පරික්ෂා කරන්න. නඩුව පටන් ගත් දිනයේ සිට මේ දක්වා ගෙවනු ලැබූ නිතීඥ ගාස්තු කොපමණද යන්න පිලිබදව අවබෝධයක් ලබා ගත යුතුය. මේ පිළිබඳව විමසීමක් කිරිමට ආදායම් පරික්ෂකතුමා සභාවට කැඳවිය යුතුය.

**ගරු සභාපතිතුමා විසින් මහ සභාව කාරක සභාවක් බවට පත් කරන බව යෝජනා කරන ලදි.**

**එම යෝජනාව ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

**ආදායම් පරික්ෂක විසින් සභාව වෙත කරුණු පැහැදිලි කරන ලදි.**

**ගරු සභාපතිතුමා විසින් නැවත කාරක සභාව මහ සභාවක් පත් කරන බව බවට යෝජනා කරන ලදි.**

**එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.**

<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>

ගිවිසුම්ගත වීමකින් අනතුරුවයි ටෙන්ඩර් කඩ භාර දෙනු ලබන්නේ. ඒ සම්බන්ධව රාජකාරි ඉටු කිරිමේදී ආරම්භයේදීම කුලි මුදල් හිඟ වන විටම අදාළ පියවර ගනිමින් එම මුදල් අය කර ගත යුතුය. එසේ නොකර විශාල හිඟ මුදලක් රැස් වන්නට ඉඩ දී අනතුරුව නඩු මහට බැසිම තුලින් විශාල ගාටළුවක් මතුවේ. එම රාජකාරි ආයතනික මට්ටමින් සිදු විය යුතුය. ප්‍රදේශවාසින් සභාවට ණයකාරයින් නොකොට කෙසේ හෝ එම මුදල් අය කර ගැනීමට පියවර ගත යුතුය. ඒ අනුව නීති මඟින් කටයුතු කළ යුතුය.

<u>ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා</u>

පස්සර ප්‍රාදේශිය සභාව මඟින් මස් වෙළඳසැල් ටෙන්ඩර් දමා තිබෙනවා. ඒ තුලින් විශාල ආදායමක් උපයා ගනු ලබනවා. ලුණුගල දිනකට රු.2500.00 ක මුදලකට මස් කඩය ලබා දෙන මෙන් පුද්ගලයෙකු මා වෙතින් ඉල්ලීමක් කොට තිබෙනවා. එවැනි පියවරක් වෙත හෝ අප ආයතනය ගමන් නොකිරිම ගැටළු සහගතය.

<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>

මීට පෙර එම යෝජනාව මා විසින් ඉදිරිපත් කරනු ලැබූ නමුත් ඒ අවස්ථාවේදී සියලු දෙනා ඒ සඳහා විරෝධය පළ කරනු ලැබුවා. එයට එකඟ වූයේ නම් ටෙන්ඩර් කිරිමට පෙර හෝ ආදායමක් ලබා ගත හැකිව තිබුනි.

<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>

ජ්‍යොෂ්ඨ මන්ත්‍රීවරුන් ලෙස ආයතනය ටෙන්ඩර් ක්‍රියාවලියෙන් බැහැර නොවිය යුතුය.මීට පෙර පැවති සභා කාලය තුල මෙම ටෙන්ඩර් ක්‍රියාවලිය සාථර්ක ලෙස පැවති අතර එම වාතර්ා අධ්‍යනය කරන ලෙස මා ඉල්ලා සිටිනවා.පුද්ගලික හිතවත්කම් මත හෝ මෙලෙස කුලි පදනම මත ලබා දීම තුලින් ටෙන්ඩර් ක්‍රියාවලිය විනාශ වීමක් සිදුවේ. මීට පෙර ප්‍රාදේශිය සභාවට අයත් මස් වෙළඳසැල පමණක් පැවති අතර විතමානය වන විට මස් වෙළඳසැල් බොහෝ ප්‍රමාණයක් ලුණුගල දක්නට ලැබෙනවා. මෙලෙස කුලියට ලබා දීම තුලින් සභාවට එකවර ලැබිය යුතු විශාල ආදායමක් අහිමි වීමක් සිදු වනු ඇත.

<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>

රජයෙන් නිකුත් කරනු ලැබූ චක්‍රලේඛයෙහි පැහැදිලිතාව සම්බන්ධ ගැටළුවක් පවතිනවා.

<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>

රජය විසින් ගත් මෙම තීරණය හේතුවෙන් කළු කඩ හිමියන් දියුණු වුවා. එම පැරණි වාතර්ා අධ්‍යනය කොට එම කායර් පටිපාටිය අනුගමනය කරන මෙන් සභා ලේකම්තුමියගෙන් ඉල්ලා සිටිමි.

<u>ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා</u>

ජනතාපුර වෙළඳසැල් ඉදි කළද ටෙන්ඩර් ලබා ගත්තේ නැත. එය ද සභාවේ ආදායමට බාධාවකි.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

මස් අනුභව කරන්නේ මුස්ලිම් ජාතිකයින් බව සමාජයේ පිලිගැනීමක් පවතිනවා. නමුත් සමික්ෂණයක් සිදු කල හොත් එම තත්ත්වය වෙනස්ය.සභාවේ කටයුතු කළ යුත්තේ පුද්ගලික මතයන් සාථර්ක කර ගැනිමේ අරමුණින් නම් එය සාථර්ක නොවේ. මස් කඩ ටෙන්ඩර් දැමිම පිළිබදව සභාවේ ගරු මන්ත්‍රිවරුන් සෘජුව හෝ වක්‍රව සිය විරෝධතාවය පළ කරනු ලැබුවා. නමුත් ඒ තුලින් මස් කඩ ආරම්භ වී කිහිප දෙනෙකු හට රැකියා අවස්ථා ද බිහි විය. එබැවින් මගේ මතය වන්නේ මස් කඩය ටෙන්ඩර් නොදැමිය යුතු බවයි.

එම වෘත්තිය ගාස්තු ගෙවීම සදහා සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/02. ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවිර මැතිතුමාගේ යෝජනා</u>**

1. රටේ ජනතාව බරපතල ආථරීක පීඩාවකට පත්ව සිටින මොහොතක මහජන නියෝජිතයින් වශයෙන් අප හට ලබාදෙන සියලුම දීමනා (වැටුප්, ඉන්ධන, ගාස්තු) කායර් මණ්ඩල, දූරකථන දීමනා ඇතුලු මහජන මුදලින් ලබාදෙන සියලුම දීමනා අත්හිටුවන ලෙසත්, මෙම යෝජනාව සියලුම ශ්‍රී ලංකා පාලරීමේන්තු නියෝජිතයින්ට අදාළ වන පරිදි යෝජනා කරමි.

| | | | | |
|---|---|---|---|---|
| ඒ මගින් ඉතිරි වන මුදල් වන | | | | |
| ප්‍රාදේශිය සභා නගර සභා | | | 8500 x 15000 = | 127000000.00 |
| සභාපතිවරු සහ නගරාධිපති | | | 350000 = 360 = | 126000000.00 |
| | | | | 25300000.00 |
| පාලරීමේන්තු | 225 | = | 1500000.00 | 337500000.00 |
| ඇමතිවරු | 50 | | 5000000.00 | 250000000.00 |
| | | | | 587500000.00 |
| කායර්ාල කුලි නිවාස ගුවන් සවාරි ආරක්ෂා වෙනත් ජනපති අගමැති | | | | 1000000000.00 |
| | | | | **15875000000.00** |

හැමෝම මේ වෙලාවේ රට ගෙන සිතා කටයුතු කළ යුතු මොහොතක්. සැබෑ මහජන නියෝජිතයට අවස්ථාව ජනතාව වෙනුවෙන්

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.බි.සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

2. ලෝක පරිසර දිනයට සමගාමීව ලුණුගල ප්‍රාදේශිය සභා බල ප්‍රදේශයේ කොස් පැල, දෙල් පැල වැනි ආථරීක බෝග පැල 5000 ක් සිටවීමටත් පරිසරයට හිතකාමී කුඹුක් පැල 2000 ක් සිටවීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**<u>05/3. හදිසි යෝජනා</u>**

**<u>05/3/1. ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා :-</u>**

**05/3/1/1.** පරිසර හිතකාමි කෘෂි කමර්ාන්තය සඳහා කාබනික නිෂ්පාදනය අවශ්‍යා පහසුකම් ලබා ගැනීම යටතේ ඉදිකරන ලද

I. ඝන අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානයට පිවිසෙන මාගර්ය ඉදිකිරීමේ කමර්ාන්තයේ කොටස් මුදල වන රු.500000.00 ක මුදල කුරිජි ග්‍රාමීය සංවධර්න සමිතිය වෙත ගෙවීමට යෝජනා කරමි.

   එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

   එම මුදල් ගෙවීම සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

II. අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානයේ පොහොර ගබඩා කාමරය ඉදිකිරීමේ ඝන කමර්ාන්තයේ කොටස් මුදල වන රු.500000.00 ක මුදල යපම්ම, හොප්ටන් ග්‍රාම සංවධර්න සමිතිය වෙත ගෙවීමට යෝජනා කරමි.

   එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.එඩ්වින් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම මුදල් ගෙවීම සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

III. ඝන අපද්‍රව්‍ය කළමණාකරන මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ල ඉදිකිරීමේ කමර්ාන්තයේ කොටස් මුදල වන රු.500000.00 ක මුදල 21 කණුව, හොප්ටන් පුබුදු ග්‍රාම සංවධර්න සමිතිය වෙත ගෙවීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.එම මුදල් ගෙවීම සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/3/1/2.** පළාත් පාලන ආයතන ශක්තිමත් කිරීමේ වැඩසටහන (ප්‍රාග්ධන) 2021 යටතේ ඉදිකරන ලද ලුණුගල වාණිජ මධ්‍යස්ථානය හා සුපිරි වෙළඳ සංකීණර්ය සඳහා දෙමහල් ගොඩනැගිල්ලක් ඉදිකිරීම කමර්ාන්තයේ කොටස් මුදල වන රු.1000000.00 ලැබී ඇති අතර, අරසන් කන්ස්ට්‍රක්ෂන් ඇන්ඩ් කොන්ක්‍රීට් වකර්ස් ආයතනය වෙත ගෙවීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම මුදල් ගෙවීම සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/3/1/3.** ලුණුගල සතොස ගොඩනැගිල්ල පහත සඳහන් ක්‍රමවේදයට අනුව බදුදීමට යෝජනා කරමි.

- බදුදෙන කාලසීමාව
- බදු දෙන දිනය
- මාසික ගාස්තුව රු.60000.00
- අත්තිකාරම් මුදල් ලබා ගන්නා මාස ගණන
- ගිවිසුම් පත්‍රය

එම යෝජනාව ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

තක්සේරුව සම්බන්ධයෙන් කතා කිරීමේදී සභාවෙන් ලක්ෂ ගණනක මුදලක් තීරණය කරන මෙන් සභාවට අවස්ථාව ලබා දුන්නද ඒ සඳහා පිළිතුරු ලැබුනේ නැත. ඒ අනුව තක්සේරුව වෙත යොමු කළ පසු රු.60000.00 ක මුදලක් ලැබී තිබෙනවා. ඒ අනුව එය වෙනස් කළ නොහැකියි.තක්සේරුවට අභියෝග කළ නොහැකියි.

**<u>ගරු මන්ත්‍රී. පි.කුමාරසිරි සමරවීර මැතිතුමා.</u>**

අප එම තක්සේරුව පිළිබඳව සෑහීමකට පත් වන්නේ නැත.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

මේ පිළිබඳව කොමසාරිස්තුමා දැනුවත් කළ යුතුයි.

**<u>ගරු මන්ත්‍රී. පි.කුමාරසිරි සමරවීර මැතිතුමා</u>**

මෙම ඉඩම තවදුරටත් ඩබ්.ඒ.පි.ජයතිලක නමින් පැවතිම ගැටළුවකි.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

එම නමින් නිදහස් කොට පවරා දී තිබෙනවා.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

මගේ අදහස වන්නේ තක්සේරුවට අභියෝග කළ නොහැකි බවයි. නමුත් අපිට අයිතියක් තිබෙනවා සභාවේ දේපල රු.60000.00 ක වැනි මුදලකට ලබා දෙනවාද කියා. ඒ අනුව එම තීරණයට මාගේ විරෝධතාවය ප්‍රකාශ කර සිටිනවා.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

මේ ගොඩනැගිල්ල හදනකොට කවුරුත් සහයෝගය දුන්නේ නෑ.සභාවට ආදායමක් ගන්න අවස්ථාවක් ලැබී ඇති විට කකුලෙන් අදින්න එපා.එසේ වුයේ නම් කලින්ම විරුද්ධ විය යුතුව තිබුනි.තක්සේරුවට විරුද්ධ විමට සභාවට හැකියාවක් නොමැත.කැමති වුවත් නැතත් එම මුදලට ලබා දීමට සිදුවේ.බිබිල ප්‍රාදේශීය සභාව මඟින් එම ගොඩනැගිල්ල ලබා දි තිබෙන්නේ රු.150000.00 කටය.මීට වඩා වැඩි වගර් අඩි ප්‍රමාණයක් ද එහි ඇත.

**<u>ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පි.අනුර වික්‍රමතුංග මැතිතුමා</u>**

ඔවුන්ගේ තක්සේරුවට විරුද්ධ බව ප්‍රකාශ කරමින් තක්සේරු දෙපාතර්මේන්තුව දැනුවත් කරන්න.එවැනි අඩු මුදලකට ගොඩනැගිල්ල ලබා දෙනවා නම් ටෙන්ඩර් කඩ හිමියන්ගේ ගාස්තුව ද අඩු කළ යුතුය.ඔවුනට ද සහනයක් ලබා දිය යුතුය.

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා</u>**

සතොස ආයතනයට දෙනවාට අපි අකමැති නොවේ. ලබා දෙන වටිනාකමටයි අපි විරුද්ධ වන්නේ. ඒ අනුව මධ්‍යස්ථ අගයක් තීරණය කරමු.

**ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා.**

නුවර පැත්තේ තට්ටු 3 - 4 ගොඩනැගිලි ලබා දී තිබෙන්නේ ලක්ෂ 3 - 4 මුදලකටය.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

අපගේ වටිනාකම වුයේ ලක්ෂ 1 ½ ක් පමණ.

**ගරු මන්ත්‍රී ඩී.එම්.අසංක විජේබණ්ඩාර මැතිතුමා**

සතොස යනු මේ දිනවල ජනතාවට අත්‍යාවශ්‍ය සේවා සපයනු ලබන ආයතනයකි. එසේම රාජ්‍ය ආයතනයකි.එබැවින් සහයෝගයෙන් යුතුව සාධාරණ ලෙස කටයුතු කළ යුතු බවයි මගේ හැඟීම.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා**

පසුගිය දිනෙක විඩියෝ පටයකින් මා දුටුවා ජනතාව වෙත ලබා දිමට රැගෙන ආ සීනි තොග ත්‍රීරෝද රථයකින් සිල්ලර වෙලළසැල් වෙත ලබා දෙන ආකාරය. එම ආයතනය ආරම්භ කලේ අපගේ කාලයේදීය.එසේ අකටයුතුකම් සිදු වන්නේ නම් හිතට වේදනාකාරිය.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/3/2. ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා**

**05/3/2/1.** අවසන් වරට ටෙන්ඩර් කළ මුදලට අදාළව මස් කඩ හා මාළු කඩ නැවත වරක් ටෙන්ඩර් කිරිමේ කටයුතු සිදු කල යුතු බව මා යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.එඩ්වින් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඉහත සඳහන් යෝජනාව සභාවේ එකමතිකව සහා සම්මත කරන ලදී.

**05/3/2/2.** සතොස ගොඩනැගිල්ල මාසික ගාස්තුව රු.ලක්ෂ එකහමාරක වටිනාකමකට යටත්ව බදු දීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඉහත සඳහන් යෝජනාව එකමතිකව සහා සම්මත කරන ලදී.

**05/3/2/3.** හොප්ටන් අම්බලන්ගොඩ ශ්‍රී මුත්තුමාරියම්මන් කෝවිලට ගණදෙවි පිළිමයක් රු.140000.00 කට යටත්ව ලබාදීමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.ඇඩ්වින් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

ඉහත සඳහන් යෝජනාව එකමතිකව සහා සම්මත කරන ලදී.

**05/3/3. ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමාගේ යෝජනා**

**05/3/3/1.** වතර්මානයේදී මෙම රටේ පවතින ආර්ථික අබර්‍ුදය මීට වඩා ඉදිරි මාස කිහිපය තුල උග්‍ර වීමේ තත්ත්වයක් දක්නට ලැබේ. එම තත්ත්වය තුල ලුණුගල ප්‍රාදේශිය සභාවෙහි එදිනෙදා කටයුතු පවත්වාගෙන යාමේ ගැටළු සහගත තත්ත්වයක් උදාවිය හැකිය. එම නිසා ප්‍රාදේශිය සභාව් දැනට පවතින අරමුදල් ඉතාම සැළකිලිමත්ව වියදම් කරන ලෙසත් ස්ථාවර තැන්පත් ලෙස ඇති මුදල් සංවධර්න හා වෙනත් කටයුතු සඳහා ලබා නොගන්නා ලෙසත්, එම මුදල් වෙනත් ගිණුමකට මාරු නොකරන ලෙසත් සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම මුදල් ගෙවීම සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/3/4.ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමාගේ යෝජනා**

**05//3/4/1.** අලකොලගල ග්‍රාම නිළධාරි වසමේ LRC ඉඩම් විශාල ප්‍රමාණයක් තිබෙනවා. එහි අක්කර 20 ක් පමණ සියලු ගරු මන්ත්‍රිවරුන්ගේ සහභාගිත්වයෙන් ගොවිපලක් ආරම්භ කිරිම සුදුසු බවට යෝජනා කරමි. කොම්පෝස්ට් පොහොර හා සේවකයින් යොදා ගනිමින් මෙම ගොවිපල පවත්වාගෙන යා හැකිය.

එම යෝජනාව ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

ගොවිපලක් සදහා බැවින් එම ඉඩම නිදහස් කොට දෙන බවට ප්‍රාදේශිය ලේකම්තුමා පැවසීය.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා**

අප රට වටේ තියෙන ඉඩම් සොයමින් කාලය නාස්ති කිරීම සිදු නොකළ යුතුය. නගර වසමේ ජනතාව වෙත වගා කිරීමට තරම් ප්‍රමාණවත් ඉඩම් නොමැත. අලකොලගල වසමේ එක් අයකු හට අක්කර 04-05 ක් පමණ තිබෙනවා. එහි අක්කර 20 ක් තිබෙනවා නම් එක් මන්ත්‍රීවරයෙකු හට අක්කරය බැගින් බෙදා දී අධීක්ෂණය මත වගා කටයුතු සිදු කිරීමට අවස්ථාව ලබා දෙන මෙන් ඉල්ලා සිටිමි. එසේම LRC ඉඩම් නිදහස් කර දීමට විශාල කාලයක් ගත වන බැවින් ඒ වන විට මෙම අබර්ුදය අවසන් වී තිබිය හැකිය.

<u>**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**</u>

වගා නොකල ඉඩම් වගා කරන මෙන් දන්වමින් චක්‍රලේඛයක් නිකුත් කොට තිබෙනවා.ඒ අනුව දීඝර් කාලින භෝග වගා නොකල යුතුය.

<u>**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා**</u>

අප සභාවේ මෙතරම් සේවක පිරිසක් සිටියදී එක මිරිස් කරලක් හදලා තියෙනවද කියලා බලන්න. ආයතනික කටයුතු හෝ සිදු කර ගැනිමට නොහැකි පිරිස් කෙසේද ගොවිපල නඩත්තු කරනුයේ. මෙවැනි අවස්ථාවක සද්භාවයෙන් යුතුව කටයුතු කළ යුතු අතර පුද්ගලික වාසි බලාපොරොත්තුවෙන් කටයුතු නොකල යුතුය. අපට ජන වරමක් මේ වන විට නෑ. ඒ අනුව දිගු කාලින තීරණ ගත නොහැකිය. පසුගිය දිනෙක පන් ලක්ෂ ගණනක් වටිනා ජෙනරේටරයක් අප ආයතනය වෙත රැගෙනවිත් තිබුනා. මම ඒ සඳහා අත්සන් තබන අවස්ථාවේදී තමයි ඒ පිළිබදව දැන ගනු ලැබුවේ. එයට මම අත්සන් කළේ නෑ. සියලුම සේවකයින් හට වැටුප් ගෙවිය යුතුය. මන්ද සියලු දෙනා ජීවත් වන්නේ මහත් අසීරුවෙන් බැවිනි.

<u>**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**</u>

ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා ඉදිරිපත් කරනු ලැබුවේ තාවකාලික යෝජනාවකි.මෙය ඉඩම් අල්ලාගැනිමේ අදහසින් කියන ලද්දක් නොවේ.ඒ අනුව ප්‍රාදේශිය ලේකම්තුමාට බලය තියෙනවා යම් කාලසීමාවක් සඳහා ඉඩම් නිදහස් කිරිමට.

<u>**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා**</u>

මා ගෞරවයෙන් යුතුව ඉල්ලා සිටිනවා අප සතු භූමියේ වගා කොට පෙන්වන ලෙසට. ඒ අනුව ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ කුඹුරු ඉඩම නිරීක්ෂණයට මා ද සහභාගි වීමට අපේක්ෂා කරන අතර ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් වගා කටයුතු ආරම්භ කළ යුතුය.

<u>**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**</u>

සභාවෙන් වගා කරන්න ඉඩමක් ඉල්ලු විට ඒ සඳහා විරුද්ධ වන අවස්ථාවක් දුටු පළමු අවස්ථාව මෙය වේ.ඒ අනුව එම යෝජනාව ඉල්ලා අස්කර ගන්නා ලෙස ඉල්ලමි.

<u>**05/3/5. ගරු මන්ත්‍රී ආර්.ජයශංකර් මැතිතුමාගේ යෝජනා :-**</u>

**05/3/5/1.** මඩොල්සිම පොදු වැසිකිළිය සම්බන්ධ ඉඩම නීත්‍යානුකූලව සභාවට පවරාගෙන එම ස්ථානයේ වෙළඳසැල් කිහිපයක් ඉදි කොට ඒ තුලින් සභාවට ආදායමක් ලබා ගැනිමට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථීර කරන ලදි.

<u>**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**</u>

ප්‍රාදේශිය ලේකම්තුමා පවසා සිටියේ එම ස්ථානයේ අක්කර 2 ¼ ක් නිදහස් කොට දෙන බවයි. LRC එකෙන් කියලා තියෙනවා නිදහස් කොට දෙන බවට.ඒ අනුව සභා තීරණ මත කටයුතු කළ යුතුයි.මම මේ සම්බන්ධව ප්‍රාදේශිය ලේකම්තුමාට ලිපි යොමු කොට තිබෙනවා.

<u>**ගරු මන්ත්‍රී ආර්.ජයශංකර් මැතිතුමා**</u>

මේ සම්බන්ධව ගිය සභා වාරයේදීත් මා කතා කලා. ගියමාසේ LRC එකෙනුත් ආවා.ඔබතුමාටත් දැනුම් දෙන්නම් කිවුවා. නමුත් ඔබතුමා ආවේ නෑ. ඔවුන් පවසා සිටියේ දැනට කසල බැහැරලන ස්ථානය හා වැසිකිළිය අතර කොට ඔවුන්ට හිමි ඉඩම් කොටසක් බවට.

ඒ අනුව ඇතුළු වීම තහනම් කරමින් පුවරුවක් ද සවි කරනු ලැබුවා. මේ සම්බන්ධව සභාව හරහා ලිපි මඟින් දැනුවත් කළ යුතුයි. මේ සම්බන්ධව ගනු ලබන ඉදිරි තීරණ පිළිබදව මා දැනුවත් කරන මෙන් ඉල්ලමි. ලිපි යොමු කරන විට මා හට ද පිටපත් යොමු කරන මෙන් වැඩිදුරටත් ඉල්ලමි.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

<u>**05/3/6.ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමාගේ යෝජනා**</u>

**05/3/6/1.** අන්තගර්ම්මාන ව්‍යාපෘතියෙ මඟින් ආයතනය වෙත ප්ලාස්ටික් බැරල් 12-15 ක් ලබා දුන් අතර එයින් 02 ක් දැනට දක්නට ලැබේ. එසේම කුලියට ලබා දීම සඳහා බැරල් 05 ක් ද වෙන් කර ගනු ලැබුවා. ඒ අනුව ඉතිරි බැරල් අස්ථානගතවීම සම්බන්ධව සති දෙකක් තුල කරුණු ඉදිරිපත් කළ යුතු අතර එසේ නොවන්නේ නම් විමශර්න කටයුතු සඳහා දැනුම් දෙන බවත් යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පී.සුබ්‍රමනියම් මැතිතුමා විසින් ස්ථීර කරන ලදි.

<u>**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**</u>

මේ පිළිබදව කඩිනමින් කටයුතු සිදු කිරිමට සභා ලේකම්තුමිය දැනුවත් කරන ලදි.

**ගරු මන්ත්‍රී එම්.බී.සමන් කුමාර මැතිතුමා.**

වතුර ටැංකි පමණක් නොවේ. විදුලි බුබුලේ සිට අස්ථාන ගත වීම් දක්නට ලැබෙනවා.පොම්ප,ඩීප් වැල්ව,මෝටර් ආදිය ද ඒ අතර වනවා. සභාගත කරනු ලබන යෝජනා ක්‍රියාත්මක කිරිම පිළිබඳව අවධානයෙන් පසු විය යුතුයි. පසුගිය සභා වාරයකදී ලුණුගල පොලිස් ස්ථානාධිපතිතුමා පිළිබඳ අදහස් පළ කල අවස්ථාවට අදාළ වාතර්ා මා වෙත ලැබුනේ නැත. තවදුරටත් මෙලෙස සිදු වන්නේ නම් මාධ්‍ය කැඳවා මේ පිළිබඳව දැනුවත් කරමි.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා**

මේ පිළිබඳව මාධ්‍ය මෙන්ම විමශර්න අංශයද දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිමි.බහුකායර් ගොඩනැගිල්ලේ ද බොහෝ උපකරණ අස්ථාන ගත වී තිබෙනවා. ලිටර් 2000 ටැංකියක් වෙනුවට ඇත්තේ ලිටර් 1000 ටැංකියකි.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

2018 වසරේදී මෙම උපකරණ පැවතියාද යන්න පරික්ෂා කළ යුතුය. පැවතියේ නම් අපට ගැටළුවක් මතු වන අතර නොතිබුනේ නම් නිකුත් කලේ කාට ද යන්න පරික්ෂා කළ යුතුය.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවිර මැතිතුමා**

මා 2018 -2019 භාණ්ඩ සමික්ෂණ කටයුතු සදහා සහභාගි වූ අතර එහිදි අන්තගර්මමාන ව්‍යාපෘතියෙන් ලද බොහෝ උපකරණ පැවතියේ නැත. අපි අල්පෙනෙත්තක් තරම් දෙයක් හෝ මෙම ආයතනයෙන් ලබා ගෙන නැත. අද දින අත්වැරදීමකින් බිඳි ගිය පිරිසිය වෙනුවට අලුත් පිරිසියක් ආයතනයට භාර දෙන්නෙමි.

**ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා**

ඉන්වෙන්ට්‍රි ලේඛණයේ කොල ගලවන්න හෝ පිටු අලවන්න හිතන්න එපා.මේ සම්බන්ධ සාක්ෂි දෙන්න හිටපු නිළධාරින් පැමිණිමට සුදානම්ව සිටිනවා.අමාත්‍යාංශයේ හෝ දිස්ත්‍රික් ලේකම් කායර්ාලයේ එම නිකුත් කල භාණ්ඩ ලේඛනගත කොට තිබෙනවා.

**ගරු මන්ත්‍රී පී.සුබ්‍රමනියම් මැතිතුමා**

මේ වන විට රට අස්ථාවර තත්ත්වයේ පවතිනවා. බිංදුවේ සිට පටන් ගත යුතුව ඇත. මිනිසුන් හැමදාම පෝලිම් වල සිටිනු දක්නට ලැබෙනවා.රාජපක්ෂ පරම්පරාව නිසා තමයි රටට මෙලෙස ගැටළුවලට මුහුණ දෙන්න සිදු වුයේ.උගන්ඩාව වැනි රටවල ඩොලර් සඟවා තිබෙන බව සමාජ මාධ්‍ය ජාලා මඟින් දුටුවා.බස් රථ ධාවනය නොවිම විශාල ගැටළුවකි.2000 න් පසුවයි රටට මෙම තත්ත්නය උදා වුයේ.ඕනෑම රටක දේශපාලනය හා නිතිය නිවැරදිව පැවතිය යුතුය.එසේ නොවු හොත් ගැටළු රැසක් උද්ගත වේ.නැව් එනකන් බලන් ඉන්න වෙලා තියෙන්නේ.

ගියමාසේ බස් නැවතුම්පලේ සිටියදි එක් පුද්ගලයෙකු මා හට පවසා සිටියේ අප ආයතනය හොර සභාවක් යනුවෙනි.මට විශාල ලැජ්ජාවක් ඇති වුවා. මෙම ඇඳුම අද දින අදින්න හිතුනේ නැත.ඒ තරමට මිනිසුන්ට දේශපාලනය අප්‍රසන්න වි තිබෙනවා. එසේම පසු ගිය සභා කාලයේ දී අන්තගර්මමාන ව්‍යාපෘතිය සාථර්කව ක්‍රියාත්මක වුවා.විශාල වැඩ කොටසක් ඉන් සිදු වුවා. වාහන වැඩි ප්‍රමාණයක් ඒ තුලින් ලැබුනා.

නමුත් එම උපකරණ දැන් පවතිනවාද යන්න ගැටළුවකි. දිනක් මාගේ ප්‍රතිපාදන යටතේ ලබා දිමට නියමිත තහඩු 20 ක් ගබඩාවේ රඳවා තිබුනද ඒවා නිදහස් කර ගෙන යාමට පැමිණි අවස්ථාවේ එහි පැවතියේ තහඩු 18 ක් පමණි. ඒ පිළිබඳව ගබඩාව සම්බන්ධ නිළධාරියාගෙන් විමසීමක් කලද පැහැදලි පිලිතුරක් ලැබුනේ නැත. නමුත් මම තහඩු 2 ක් මිලට ගෙන එම තහඩු ලබා දුන්නා.නිළධාරින් හා මුරකරුවන් සිටියදී මෙලෙස සිදුවිම කණගාටුවට කරුණකි. නව සභා ලේකම්තුමිය යටතේ රාජකාරි විධිමත්ව සිදු වන බවක් දක්නට ලැබෙනවා.එය සතුටට කරුණකි.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

එම අස්ථාන ගත විම පිළිබඳව මා දැනුවත් කලේ නැත.

**ගරු මන්ත්‍රී පී.සුබ්‍රමනියම් මැතිතුමා**

වතුකරයේ ඉඩකඩ සම්බන්ධව ගැටළු තිබෙනවා.ආථර්ික ගැටළු ද විශාල වශයෙන් පවතිනවා.රජයේ මැදිහත් විමෙන් හෝ ඒවාට විසඳුම් ලබා දෙන මෙන් ඉල්ලා සිටිනවා. ඒ පිළිබඳව වතු සමාගම් දැනුවත් කරන ලෙසත් දන්වා සිටිනවා.ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනාව කාලෝචිතයි.එය පාලර්ිමේන්තුවේ සිට පුවර්ාදශර්ය සැපයිය යුතුය.විශාල මුදලක් ඒ තුලින් ඉතිරි කර ගත හැකි වනු ඇත.ඉදිරි කාලය අති දුෂ්කර කාලයක් වනු ඇත.රසායනික පොහොර තහනම් කරනු ලබන අවස්ථාවේදීම මා පැවසුවා 1972-1977 වැනි කාලයක් නැවත පැමිණෙන බවට. එය අද සත්‍ය වි තිබෙනවා. ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවීර මැතිතුමා මිටපෙර වටිනා යෝජනා කිහිපයක් ගෙනහැර දක්වා ඇති නමුත් ඒ සඳහා අවධානය යොමු වුයේ නැත. එසේම සභාවේ වියදම හැකි තරම් අවම කොට ජනතාවට සේවාවක් සළසන ලෙස ඉල්ලා සිටිනවා.

**05/3/7.ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමාගේ යෝජනා**

**05/3/7/1.** කුරුවිගොල්ල සිට පස්සර දක්වා බස් රථ විශාල ප්‍රමාණයක් ධාවනය වුවද පිටමාරුව පස්සර හා ඇකිරිය පස්සර දක්වා බස් රථ ධාවනය වීම අවම මට්ටමේ පවතී. ඒ හේතුවෙන් එළමාන සිට මඩොල්සිම හා කුරුවිගොල්ල පාසල් සඳහා පැමිණෙන දරුවන් අසීරුවට පත්ව තිබෙනවා. මාසික වාර ප්‍රවේශ පත්‍ර ද ලබා ගෙන ඇති නිසා බස් රථයක් යෙදවිය යුතුමය. ලංගම මඟින් විමසීම් කළ විට පැවසුයේ ටයර් නොමැති වීම හා ඉන්ධන නොමැති වීම මීට හේතුව වී ඇති බවයි.දරුවන් අනාරක්ෂිතව පයින් ගමන් කරනු ලබයි.එසේම මඩොල්සිම සිට ලුණුගල දක්වා ද බස් රථයක් නොමැත. ඒ හේතුවෙන් මඟින් විශාල පීඩාවකට පත්ව තිබෙනවා. මේ පිළිබඳව මටද පිටපත් සහිතව කඩිනමින් අදාළ ආයතන දැනුවත් කරන මෙන් යෝජනා කර සිටිමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවිර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතතුමා**

බස් රථ ධාවනය කිරිමේදී ටයර් හා ඉන්ධන ගැටලුව පවතිනවා. ටයර් ගැටළුව මත දිවයිනෙන් බස් රථ 1000 ක් පමණ ධාවනයෙන් ඉවත් කොට තිබෙනවා. ටයර් මිළ අසීමිත ලෙස ඉහල ගොස් තිබෙනවා.බදුල්ල ඩිපෝවේ බස් රථ 70 ක් දක්වා අඩු වි තිබෙනවා.ටෙන්ඩර් ක්‍රමයේදි මිළ විචලනය වීම ප්‍රධාන හේතුව වේ.ශ්‍රී ලංකා මගී ප්‍රවාහන කායර්ාලයට හා පුද්ගලික මගී ප්‍රවාහන කායර්ාලයට මේ පිළිබඳව දැනුම් දෙන්න. කුරුවිගොල්ල දක්වා පස්සර සිට බස් රථ විශාල ප්‍රමාණයක් තිබෙනවා. බස් රථ සම්බන්ධව තිබෙන ගමනාන්තයට අදාළ නීතිය යටතේ එකාබද්ධ මාගර්යක් බවට පත් කර දෙන මෙන් ඉල්ලීමක් කළ යුතුය.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/3/7.ගරු මන්ත්‍රී ජේ.පරමසිවම් මැතිතුමාගේ යෝජනා**

**05/3/7/2.** වලර්ඩ් විෂන් ආයතනය යනු ප්‍රදේශයට විශාල සේවයක් සිදු කරනු ලබන ආයතනයකි. එහි පයෙර්ෂණ අවස්ථාවට මා ද සහභාගි විය. සහතිකපතක් ද ලැබුනි.නමුත් මේ නව විට ප්‍රතිලාභ ලැබිය යුතු අඩු ආදායම්ලාභි දරුවන් පසෙක ලා රජයේ සේවකයින්ගේ දරුවන්ට එම ආධාර ලබා දෙනු ලබයි.මේ පිළිබඳව විමසූ විට ඔවුන් පැවසුයේ ආරම්භයේ සිටම ඔවුන් සමඟ එම දරුවන් බැඳී සිටින බැවින් ඔවුන් ඉවත් කල නොහැකි බවයි. සියල්ලටම ආධාර ලැබිය යුතු නමුත් අඩු ආදායම්ලාභීන්ට මුල් තැන හිමි විය යුතුය. එලෙස කටයුතු කිරිම පිළිබඳව වලර්ඩ් විෂන් ආයතනය දැනුවත් කරන මෙන් යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවිර මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා**

හැම ගමකම මෙම ගැටළුව දක්නට ලැබෙනවා.තෝරාගත් පිරිසක් වෙත පමණයි ප්‍රතිලාභ හිමිවන්නේ.එම ආයතනය මඟින් ඉල්ලිමක් කළ යුතුයි මෙම කායර්යන් විනිවිදභාවයකින් යුතුව සාධාරණව සිදු කල යුතු බවට.මෙයින් අගතියට පත් වන පිරිසකුත් සිටින බවට දැන්විය යුතුය.

**මන්ත්‍රී ආර්.ජෙයශංකර් මැතිතුමා**

වලර්ඩ් විෂන් ආයතනය මඟින් ප්‍රදේශයේ දුවා දරුවන් වෙත බොහෝ වැඩ කටයුතු සිදු කරනු ලබන අතර එය අප අගය කළ යුතුයි.ගම් මට්ටමින් පත් කොට සිටින නායකයින්ගේ ක්‍රියාවන් හේතුවෙන් යම් යම් අකටයුතුකම් සිදු වන ආකාරය දක්නට ලැබෙනවා.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**05/3/8.ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමාගේ යෝජනා**

**05/3/8/1.** සභාවේ ආථිකයට ශක්තියක් වීමේ අරමුණින් සෑම සභා වාරයකම සිදු කරනු ලබන සංග්‍රහ කටයුතු අත්හිටුවීමට මීට පෙර මා විසින් යෝජනා ඉදිරිපත් කරන ලද නමුත් සභාවේ ගරු මන්ත්‍රී මණ්ඩලයේ බහුතර ඉල්ලීම මත එම යෝජනාව ඉල්ලා අස් කර ගන්නා බවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී පි.ලෝගනාදන් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

එම යෝජනාව සභාව ඒකමතිකව සම්මත කරන ලදී.

**06. කාරක සභා වල වාතර්ා සලකා බැලීම.**

**06/1. මුදල් කමිටු වාතර්ාව**

2022.06.02 දින පැවති මුදල් කමිටු වල නිදෙර්ශ කමිටු ගරු සභාපති සී.ජගත් චන්ද්‍ර දළුකොටුව මැතිතුමා විසින් සභාවට ඉදිරිපත් කරන ලදී.

**06/1/1. සංශෝධන**

**ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා.**

මුදල් කමිටු වාතර්ාවේ 08 වැනි හා 10 කරුණට අදාළව සිදු කල කායර්ය හා බිල්පත් මෙන්ම කිලෝ මිටර් ප්‍රමාණය සම්බන්ධ විස්තර සභා ගත කරන්න.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

අදාළ විෂය නිළධාරියා අද දින සේවයට නොපැමිණ ඇති අතර ඉදිරියේදි එම තොරතුරු ලබා දෙන්නම්.එසේම සේවා කිරිමේදී බෝල් ජොයින්ට් මෙන්ම රක් 01ක් දාලා තියෙනවා.

**<u>ගරු මන්ත්‍රී පි.කුමාරසිරි සමරවීර මැතිතුමා.</u>**

සභාව දිනයට සියලු නිළධාරින් සේවයට කැඳවිය යුතුය. එසේම සභාවට යොමු කරනු ලබන ලේඛණ සවිස්තරාත්මකව ඉදිරිපත් කළ යුතුයි. කිහිප අවස්ථාවකදීම මේ සම්බන්ධව කරුණු ගෙන හැර දක්වා තිබෙනවා. එසේම මුරකරුගේ ලේඛණයේ දෛනිකව සභාවට පැමිණ හා පිටවි ඇත්තේ වාහන 03 ක් පමණි.එය ගැටළුවකි.

**<u>ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා</u>**

හෙට සිට අලුතින් පොතක් යොදවා එම කායර්ය නිවැරදිව සිදු කරවා ගන්නා මෙන් සභා ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදි.

**2022.06.02 වන දින පැවති මුදල් කමිටු වල නිදෙර්ශ ඉහත සංශෝධන වලට යටත්ව සභා සම්මත විය යුතු යැයි ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව එම නිදෙර්ශ සභා සම්මත විය.**

**06/2. නිවාස හා ප්‍රජා සංවධර්න කමිටු වාතර්ාව - නැත**

**<u>06/3. පරිසර හා පහසුකම් කමිටු වාතර්ාව</u>**

2022.06.07 වන දින පැවති පරිසර හා පහසුකම් කමිටුවේ වාතර්ාව කමිටුවේ සභාපති ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.

**<u>06/3/1. සංශෝධන</u>**

**<u>එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා</u>**

මෙම යෝජනා කොලේකට සීමා කරලා තියන්න එපා. හිටපු සභා ලේකම්තුමා සමඟ සාකච්ඡා කරා. එතුමා පවසා සිටියේ කොස් පැල බද්ධ කිරිම සාථර්ක නොවු බවත්, කටු අනෝදා පැළ අවශ්‍ය නම් ලබා දිය හැකි බවත්ය. එසේම ගරු මන්ත්‍රි පි.කුමාරසිරි සමරවීර මැතිතුමා සමඟ සාකච්ඡා කොට හඳ බිම අධිකාරිය මඟින් අවශ්‍ය පැළ ලබා ගන්නා මෙන් ඉල්ලා සිටිමි. ආයතනික මට්ටමින් කතා කොට මෙම කායර්ය සිදු කළ යුතුය. එවිට වගකීමෙන් යුතුව ගෙවිම් කටයුතු සිදු කළ හැකිය.

**2022.06.07 වන දින පැවති පරිසර හා පහසුකම් කමිටු වල නිදෙර්ශ ඉහත සංශෝධන වලට යටත්ව සභා සම්මත විය යුතු යැයි ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරෝ මැතිතුමා විසින් යෝජනා කරන ලදි. එම යෝජනාව ගරු මන්ත්‍රී එස්.එච්.එල්.චන්දන සමන් කුමාර මැතිතුමා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව එම නිදෙර්ශ සභා සම්මත විය.**

**06/4. කාමරීක සේවා කමිටුව - නැත**

## <u>07. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ /එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාතර්ා සහ ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කිරීමට නියමිත වෙනත් ලේඛන ඉදිරිපත් කිරීම හා සළකා බැලීම.</u>

**<u>07/1. සංශෝධන</u>**

**<u>ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා</u>**

ආදායම් පරික්ෂක මහතා විසින් බලපත්‍ර ගාස්තු සැහෙන ප්‍රමාණයක් අය කර ගෙන ඇති මුත් කඩ කුලි මුදල් ගෙවීම අවම මට්ටමේ පවති. බලපත්‍ර ගාස්තු ගෙවනුයේ ප්‍රදේශයේ වෙළඳසැල් හිමියන් හා කමර්ාන්ත කරුවන්ය. නමුත් සභාවෙ දේපල භුක්ති විදිනු ලබන පුද්ගලයින් කුලි මුදල් ගෙවා නොමැත. මෙවැන අවස්ථා පිළිබඳව අවධානය යොමු කරන්න. එවැනි දේපල පවරා ගැනිම හෝ මුද්‍රා තැබිම කළ යුතුය.

ගමන් වියදම් රු.94000.00 ක ප්‍රමාණයක් තිබෙනවා. කලින් සභා කාලයේදී ගරු මන්ත්‍රිවරුන් හටද ගමන් වියදම් ගෙවන ලදි. ඒ සදහා ද අවධානය යොමු කොට එම ගෙවීම් කටයුතු සිදු කරන්න.එසේම

විපීරේථා සම්බන්ධ විස්තරයක් මා වෙත ලැබී තිබෙනවා. අත්තනගොල්ල විජේසිංහ යන අයගේ විපී රේඛාව සම්බන්ධ තොරතුරු මෙහි ඇතුලත් ව නොමැත.

**ගරු සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

එම වාතර්ාව ලබා දෙන ලදි. ලද සියලුම නිරවුල් ලේඛන සඳහා සහතික නිකුත් කොට තිබෙනවා.

**2022 මැයි මස ලැබීම්, ගෙවීම් පිළිබඳ මාසික ප්‍රකාශ හා එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාතර්ාව සංශෝධන වලට යටත්ව සත්‍ය වාතර්ාවක් බව සභා සම්මත විය යුතු යැය ගරු මන්ත්‍රී ආර්.ඩබ්.ඩබ්.එඩ්වින් මැතිතුමා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී එම්.ජේ.එම්.ජරුක් මැතිතුමා එම යෝජනාව ස්ථිර කිරීමෙන් අනතුරුව එම වාතර්ාව සභා සම්මත විය.**

## 08. වෙනත් කරුණු

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවිර මැතිතුමා.**

පරිසර කමිටුවේ තීරණ බොහෝ කාලෝචිත වනු ඇත.කොස් පැළ වෙනුවට වරකා වගර්යේ පැළ ලබා දෙනවා නම් වඩාත් සුදුසුය.සේවකයින් යොදවා නගරය පිරිසිදු කිරිමේ කටයුතු සඳහා මමද සහභාගි වන්නම්.මාසෙකට දිනයක් යොදවා එම කායර්ය සිදු කල හැකිය. කලින් දිනයක් ලබා දිය යුතුය.

එසේම වලප්ඩ් විෂන් ආයතනය මගින් ගොවිජන සේවා කායර්ාලය එක්ව බොජුන් හලක් ස්ථාපිත කරනු ලැබුවා. රැකියා අවස්ථා 06 ක් නිමර්ාණය කොට තිබෙනවා. එසේම ගොවිජන සේවා කායර්ාලයෙන් වගා කල සියලු ගොවින් එය කාබනික පොහොර ලබා දීමට නියමිතය. එසේම මාගේ කුඹුරු අක්කර 02 මාස 02 ක් තුල වගා කිරිම ඇරඹිය යුතුය. නැවත වසර 03 ක් තුල භාර දිය යුතුය. නිත්‍යානුකූලව පවරා දෙන්නම්.

**සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

වී වගා කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරන්නම්.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවිර මැතිතුමා**

දරුවන්ගේ පෝෂණය පිළිබඳව සැළකිලිමත් විය යුතුය. සභාවේ පෙර පාසල් 06 සඳහා සතියකට ආහාර වේල් 02 ක් හෝ (පෝෂණීය වටිනාකමින් යුතු) ලබා දිය හැකි නම් එය වඩාත් සුදුසුය. වලප්ඩ් විෂන් ආයතනය මගින් දැනට ජයබිම විද්‍යාලයට ආහාර ලබා දෙනු ලබයි.

එසේම දෛනික සේවකයින්ගේ සේවා දින ගණන 10 ක් දක්වා අඩු කිරිමට යන බවට ආරංචි වන අතර එලෙස සිදු නොකරන මෙන් ඉල්ලා සිටිමි. අමතර රාජකාරියක හෝ යොදවා දින 20 ට ගෙවීම් කරන මෙන් ඉල්ලා සිටිනවා. අපේ සේවකයින් අපි ආරක්ෂා කර ගත යුතුය. කුමන හෝ වගාවක් සඳහා හෝ යෙදවිය හැකිය.

**සභාපති චමින්ද ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

චක්‍රලේඛයක් මගින් දැනුම් දී තිබෙනවා.

**ගරු මන්ත්‍රී.එම්.බී.සමන් කුමාර මැතිතුමා.**

ඔය චක්‍රලේඛ සකස් කරනු ලබන නිළධාරින් තමයි රට විනාශ කරේ.අසාධාරණ තීන්දු ගැනීමට ඉඩ නොදිය යුතුය. අපේ කායර් මණ්ඩලයට සහනයක් ලබා දිය යුතුය.පුද්ගලයින් ලියාපදිංචි කිරිමේ දෙපාතර්මේන්තුව මගින් තිරණයක් ගෙන තිබෙනවා ජාත්‍යන්තර මට්ටමේ හැඳුනුම්පතක් සකස් කළ යුතු බවට. එයද සකස් කරනුයේ ඉන්දියාවෙන් ලැබෙන ආධාර මත විම පුදුම සහගතය. මිනිසුන්ට කන්න හෝ නොමැති කාලයක මෙවැනි තීරණයක් ගැනිම ගැටළු සහගතය.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවිර මැතිතුමා.**

කොළඹ - ලුණුගල දක්වා ගමන්ගත් බස් රථය ලුණුගල ලෙස ගමනාන්තය යොදා බදුල්ලෙන් නැවත හැරී යන ආකාරය දක්නට ලැබෙනවා. මේ පිළිබඳව ද අදාළ ආයතන දැනුවත් කළ යුතුය.

**ගරු මන්ත්‍රී ඩබ්.ඒ.පී.අනුර වික්‍රමතුංග මැතිතුමා**

දින 02 ක් මම එම බස් රථයෙන් පැමිණ බදුල්ලෙන් බැස ඒමට සිදු වුවා.

**ගරු මන්ත්‍රී පී.ලෝගනාදන් මැතිතුමා.**

පීස්ස හා බෙසම යන සංචාරක ස්ථාන වෙත ටිකට්පත් නිකුත් කිරිමේ කටයුතු කඩිනම් කළ යුතුය.

**ගරු සභාපති සී.ජගත්චන්ද්‍ර දළුකොටුව මැතිතුමා**

මේ වන විට ටිකට් පත් සකස් කොට අවසන් කර ඇත.

**ගරු මන්ත්‍රී පී.කුමාරසිරි සමරවිර මැතිතුමා.**

කෙතරම් අපහසුතා පැවති පසුබිමක වුවද ආයතනයට නව බඳවා ගැනිම් සිදු කිරිමට උත්සහ ගන්නා බවක් පෙනී යන අතර, එලෙස චක්‍රලේඛයට පරිබාහිරව කටයුතු කිරිම සම්බන්ධව කණගාටු වෙමි.

**ගරු මන්ත්‍රී ඩී.එම්.අසංක විජේබණ්ඩාර මැතිතුමා.**

ගරු මන්ත්‍රී ගරු මන්ත්‍රී ආර්.එම්. සිරියාවති මැතිනිය අසනීප වීම හේතුවෙන් අද දින සභාවට නොපැමිණෙන බවට දුරකථනයෙන් දැනුම් දුන් බවත්, එම ගරු මන්ත්‍රීවරියගේ නිවාඩු අනුමත කර දෙන ලෙසත් සභාවේ යෝජනා කරන ලදී.

එම ගරු මන්ත්‍රීවරියගේ නිවාඩු අනුමත කිරීමේ යෝජනාව ගරු මන්ත්‍රී ඩී.එම්.තිලකසිරි දිසානායක මැතිතුමා විසින් ස්ථිර කරන ලදී.

එම යෝජනාව සභාවේ ඒකමතිකව සම්මත කරන ලදී.

**න්‍යාය පත්‍රය අනුව අද දින සභා රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.**

**මීලග මහ සභා රැස්වීම 2022.07.21 වන දින පෙ.ව.10.00 ට පවත්වන බව ගරු සභාව විසින් තීරණය කරන ලදී.**

(සී.ජගත්චන්ද්‍ර දලුකොටුව),
සභාපති,
ප්‍රාදේශිය සභාව,
ලුණුගල.